# තරණය

**ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2024 -පළමු කලාපය**

## 2024 නව වසරේ ආරම්භය.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2023 යටතේ ලබා දී ඇති උපදෙස් හා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයද කාර්යාල කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී මහ ජනතාවට කාර්යක්ෂමව හා ඵලදායීව රාජ්‍ය සේවාවන් ලබාදීම සඳහා තිර අදිටනින් කැපවන බව ආයතනයේ අධ්‍යක්ෂතුමිය ඇතුළු බොරැල්ල, පිළිමතළාව කාර්ය මණ්ඩලය රාජ්‍ය සේවා ප්‍රතිඥාව ලබාදීම සිදුකළ අතර ජනාධිපති කාර්යාලයේ පැවති නිල උත්සවය සඳහාද Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙමින් 2024 වසර ආරම්භ කරන ලදී.









## නව අධ්‍යක්ෂතුමියට කාර්ය මණ්ඩලයේ සුභ පැතුම්............

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නව අධ්‍යක්ෂ ලෙස පත් වූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක වන තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මියට අධ්‍යක්ෂධූරයේ කාර්යභාරය මැනවින් ඉටු කිරීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි අපගේ සුභ පැතුම්.....



## මානව හිතවාදියෙකුගේ සමුගැන්ම.

අප ආයතනයේ 2023 වර්ෂයේ අධ්‍යක්ෂධූරයේ කටයුතු කරන ලද ආර්.කේ.සමන් අනුර ද සිල්වා  මහතා වසර 25කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කටයුතු කරන ලද කාර්යශූර, දක්ෂ, උතුම් මහත්මා ගුණයෙන් සපිරි, මිනිසුන් වෙනුවෙන් වැඩකළ, ඔවුන් සමඟ ජීවත් වූ, සුහද මානව  හිතවාදියෙක් විය. සෙසු පෞද්ගලික අරමුණු පසෙකලා විවිධ අභියෝග හා තර්ජන මැද  ප්‍රජාව වෙනුවෙන් වැඩකිරීම තම ප්‍රධාන රාජකාරිය කොටගත් ඔහු සරල වූද, අවංක වූද නිර්ව්‍යාජ වූද නිලධාරියෙකු විය. එහෙත්......නොසිතූ මොහොතක 2023 වර්ෂයේ නොවැම්බර් මස 29 දින මාවනැල්ල නගරයේදී ඔහු අවාසනාවන්ත ලෙස හදිසි අනතුරකට ලක් විය.



ආදරණීය මහත්මයාණනි......

දුප්පත් මිනිසුන් උදෙසා.........

ඔබ යළිත් අප අතරම ඉපදේවා ..!

මීට,

සහෘද නිලධාරි පිරිස

බොරැල්ල/ පිළිමතලාව

## කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය උදෙසා....

### ලිපි ගොනුකරණය.

2024.01.09 වන දින බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය විසින් මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මෙහිදි ලිපිගොනු විධිමත්ව හා ක්‍රමානුකූලව පවත්වාගෙන යන ආකාරය හා එහි අවශ්‍යතාවය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලද අතර පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරීන් මාර්ගගත ක්‍රමයට මේ හා සම්බන්ධ වන ලදී.





## රාජ්‍ය සේවයේදී අධ්‍යාත්මික සංවර්ධනය.

ආයතනයේ කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවේ දෙවන අදියර 2024.02.21 වන දින බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විය. රාජ්‍ය නිලධාරීන් සේවයේ නිරත වීමේදී අධ්‍යාත්මික වශයෙන් තම ජීවිත ගොඩනගා ගත යුත්තේ කෙසේද යන්න පිළිබඳ මෙහිදී දැනුවත් කරන ලදී. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලද්දේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවය කළ පළාත් ප්‍රධාන ලේකම්වරයකු වූ දැනට විශ්‍රාමික නිලධාරියකු වන විජය වික්‍රමරත්න මහතා විසිනි. මේ සඳහා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නිලධාරීන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ විය.





## රාජ්‍ය ආයතනයක වට්ටෝරු භාණ්ඩ නිවැරදිව ලේඛනගත කිරීම.

ආයතනයේ කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන් මාලාවේ තුන්වන අදියර 2024.03.20 දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. රාජ්‍ය ආයතනයක වට්ටෝරු භාණ්ඩ ලේඛනගත කිරීම, පවත්වාගෙන යාම සහ එහි වැදගත්කම පිළිබඳ දැනුවත් කළ අතර මේ සඳහා සම්පත් දායකත්වය කළමනාකරණ සේවා නිලධාරී කේ.කේ.චිත්‍රා රාජරත්න මහත්මිය විසින් ලබා දෙන ලදී. බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය මාර්ගගත ක්‍රමය ඔස්සේ මේ සඳහා සම්බන්ධ විය.





## ප්‍රජාව සවිබලගැන්වීම උදෙසා පුහුණු වැඩසටහන්.

### ග්‍රාමීය තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා මහනුවර දිස්ත්‍රික් කුඩා තේවතු සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධ වෙමින්......

මහනුවර දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ 32,000 කට අධික කුඩා තේවතු ප්‍රජාවක් සමඟ කටයුතු කරන කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා "ග්‍රාමීය තරුණ ප්‍රජාව බල ගැන්වීමේදී වර්ධනය කරගත යුතු නිලධාරි කුසලතා" යන මාතෘකාව යටතේ පුහුණු වැඩමුළුව 2024.02.14 ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී. මේ සඳහා සම්පත්දායකත්වය පුහුණු පර්යේෂණ නිලධාරි ආචාර්ය ඩී.ඒ.පී.දාස්වත්ත මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ.එම්.ජී. සමරසේන මහතා විසින් ලබා දෙන ලදී.

නිලධාරින්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීම තුළින් තේ වගාවේ ඵලදායිත්වය ඉහළ නැංවීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරිණි. කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ මහනුවර දිස්ත්‍රික් ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සම්පත්දායකත්වයෙන් මෙම වැඩමුළුව පවත්වන ලදී. මෙම පුහුණු වැඩමුළුවේ සම්බන්ධකරණය සංවර්ධන නිලධාරි එස්.බී.එන්. මල්ෂානි ආනන්ද මෙනවිය විසින් සිදුකරන ලදී.





## ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය මීගමුවට.

මෙම පුහුණු වැඩසටහන 2024 පෙබරවාරි මස 20, 21, 22 යන තෙදින පුරා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදි පැවත්විය. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරි ආචාර්ය ඒ.එම්.එස්. අතපත්තු මහතා සහ පුහුණු පර්යේෂණ නිලධාරි නිහාල් වීරසූරිය මහතා විසින් ලබා දෙන ලදි. මේ යටතේ මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ක්ෂේත්‍ර නිලධාරින් පුහුණු කිරිම සිදු කළ අතර පුහුණු වැඩමුළුව සම්බන්ධිකරණය කළේ කේ.ඩබ්. අයිරංගනී මහත්මිය විසිනි.





## ග්‍රාමශක්ති ප්‍රතිලාභීන් උදෙසා ව්‍යවසායකත්ව සංවර්ධනය.

යටිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මෙහෙයවීම යටතේ 2024.02.22 වන දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ යටිනුවර ග්‍රාමශක්ති ප්‍රතිලාභීන් උදෙසා මෙම පුහුණු වැඩසටහන පවත්වන ලදි. මේ සඳහා සම්පත්දායකත්වය පුහුණු පර්යේෂණ නිලධාරි ආචාර්ය ඩී.ඒ.පී.දාස්වත්ත මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ .එම්.ජී. සමරසේන මහතා විසින් ලබා දෙන ලදි.







## ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය අම්පාර මහඔයට.

මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවිධානයෙන් හා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සම්පත් දායකත්වයෙන් ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව 2024 මාර්තු මස 05, 06 සහ 07 යන දිනයන්හීදී මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. මේ සඳහා සංවර්ධන නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි කළමනාකරුවන් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරීන් 40 දෙනකු සහභාගි විය. මෙහිදි කණ්ඩායම් ක්‍රියාකාරකම්, කණ්ඩායම් අභ්‍යාස හා සාකච්ඡා තුළින් ප්‍රජා ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම පුහුණුලාභීන්ට ලබා දෙන ලදී.

පුහුණු වැඩමුළුව අවසානයේ සහභාගිවූවන්හට මහඔය ප්‍රාදේශීය ලේකම් තිළිණ වික්‍රමරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සහතික පත් බෙදා දීම සිදුකරන ලදී.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු අංශ ප්‍රධාන කේ.එම්.ජී.සමරසේන මහතා සහ පුහුණු හා පර්යේෂණ නිලධාරී එස්.ඩී.අල්ගම මහත්මිය මෙම පුහුණු වැඩමුළුවට සම්පත් දායකත්වය ලබාදෙන ලදී. වැඩමුළුව සම්බන්ධිකරණය සංවර්ධන නිලධාරී කේ.බී.ධර්මප්‍රිය මහතා විසින් සිදු කරන ලදි.





## ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය

2024 මාර්තු මස 13, 14 හා 15 යන දිනයන්හි මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී මෙම පුහුණු වැඩමුළුව පැවැත් වූ අතර මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී ඩබ්.එච්.සිරිසේන මහතා විසින් සපයන ලදී.





## ග්‍රාමීය සංවර්ධනයේ නව දැනුම කරා පර්යේෂණ ....

### වර්තමාන ග්‍රාමීය ගොවිතැනේ යථාර්ථය හා ග්‍රාමසංවර්ධනය

බත බුලතින් ස්වයංපෝෂිත වූ රටක් තැනීමේදී ගොවියා මහඟු කාර්යභාර්යක් ඉටු කරනු ලබයි. පිටරටින් සෑම දෙයක්ම රැගෙන එනතුරු මුහුදට දත නියවා බලා නොසිට දහදිය වගුරු හෙළමින් ජනතාවගේ කුස පුරවන්නේ **‘මඩ සොදාගත් කළ රජකමටත් සුදුසුයි.’** කියන්නා වූ ගොවියා ය.

එහෙත් වර්තමානය වන විට පාරම්පරික අපේ ගොවිතැන විනාශ මුඛයට ගමන් කරමින් ගොවියා විවිධ ග්‍රහණයන්ට හසු වී සදාකලික ණයකරුවෙක් බවට පත්වෙමින් සිටී. මීට හේතු රාශියකි.

මේ පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරමින් මධ්‍යම පළාතේ මහනුවර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල මිනිපේ, නිල්දණ්ඩාහින්න හා රත්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ගම්මාන තුනක වී, එළවළු හා ගෙවතු වගා ආශ්‍රිත ගොවින් කණ්ඩායම් තුනක් පාදක කරගනිමින් ‘ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මික කටයුතුවල වර්තමාන තත්වය හා එය ග්‍රාමසංවර්ධනය කෙරෙහි සිදුකර ඇති බලපෑම හඳුනා ගැනීම’ පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක් පුහුණු හා පර්යේෂණ නිලධාරී **එස්.එම්.යූ.බී.සමරකෝන්** මහතා විසින් සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයන වාර්තාව දෙසැම්බර් මාසය වනවිට ප්‍රකාශයට පත් කිරීමට නියමිත ය.







## ආයතනයේ ප්‍රකාශන අංශයෙන් ඔබට සේවය.

### පුස්තකාල පහසුකම්.

දැනුම සොයන ඔබට ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ බොරැල්ල ප්‍රධාන කාර්යාලයේ සහ පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ පුස්තකාල පහසුකම් විවෘතව ඇත. සෑම රජයේ වැඩකරන දිනයකම පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා පුස්තකාල ග්‍රන්ථ පරිශීලනය සඳහා අවස්ථාව සපයා දී ඇත. ග්‍රාමීය සංවර්ධනය, සංවර්ධනය, සමාජ විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ග්‍රන්ථ එකතුවක් මෙම පුස්තකාල සතු වේ. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන පර්යේෂණ වාර්තා, ශාස්ත්‍රිය සඟරා, වාරික සඟරා ඇතුළු ග්‍රන්ථ ගණනාවක් පරිශීලනයට මෙන්ම ඉතා සහනදායි මිලගණන් යටතේ මිලදී ගැනීමට ද පහසුකම් සපයා ඇත.


අමතන්න -

චිත්‍රා ජයසිංහ මිය

පුහුණු හා පර්යේෂණ නිලධාරී

බොරැල්ල

0771163677

කපිල ධර්මප්‍රිය මහතා

සංවර්ධන නිලධාරී

පිළිමතලාව

0774451199




## පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ ඵලදාව ඉහළ නැංවීම සඳහා.

පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ භූමිය තුළ අපනයන කෘෂි භෝග සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරී මහේෂ් කාංගර මහතා විසින් අවශ්‍ය උපදෙස් ලබාදුන් අතර මේ යටතේ ගම්මිරිස්, කෝපි, සාදික්කා, පුවක්, වැනිලා යන කෘෂි අපනයන භෝග ආයතන භූමියේ රෝපණය කරන ලදී.







## ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන්.

ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය සංවිධානය කරන ලද ලියශක්ති කාන්තා ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය පැවැත්වුයේ මාර්තු 08 දිනට යෙදී තිබු කාන්තා දිනය වෙනුවෙනි. මෙම ප්‍රදර්ශනය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ පිහිටි දියත උයනේදී පැවැත් වූ අතර මේ සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය යටතේ වන ආයතන සඳහා වෙන්කළ භූමියෙහි ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරීන් කිහිපදෙනෙක් සම්බන්ධ වෙමින් ආයතනයේ සේවාවන් පිළිබඳව සේවාලාභීන් දැනුවත් කිරීම සිදු විය.





### තරණය තරණය කළෝ..........

### උපදේශකත්වයෙන්


තිලිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්.ජී.පී.වේරවැල්ල
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය


### සංස්කරණයෙන්


එස්.එම්.යූ.බී.සමරකෝන්
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එච්.එම්.ජී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය


### ප්‍රකාශනය


ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය



ප්‍රධාන කාර්යාලය :

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
24/4, කාසල් වීදිය
කොළඹ 08
දුරකථන- 011 2678203 / 011 2695579
ෆැක්ස් -011 2696592
ඉ-තැපැල slrdtri@gmail.com

පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානය:

ග්‍රාමසංවර්ධන මාවත, පිළිමතලාව
දුරකථන- 081 2575292 /081 2579929
ෆැක්ස් - 081 2579929
ඉ-තැපැල dodd@gmail.com

## 2024 වර්ෂයේ අපෙන් ඔබට පුහුණු පාඨමාලා....

- **සමාජ සජීවීකරණය**
- **ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජාසහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය**
- **ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය**
- **සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය**
- **පුහුණු වැඩසටහන් සැලසුම්කරණය හා කළමනාකරණය**
- **විපර්යකාරක පුහුණුකරු පුහුණුව**

මෙම පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලුම වැඩකරුවන් හට ඉල්ලුම් කිරිමේ හැකියාව ඇත. ඉහළ දැනුමක් හා පිළිගත් සහතිකයක් ලැබෙන අතර අදම අප ආයතනය අමතන්න.

## අප සතු සම්පත්..............

- පුස්තකාල පහසුකම්
- පිරිසිදු ජල පහසුකම්
- දේශනශාලා පහසුකම්
- ශ්‍රවනාගාර පහසුකම්
- භෝජනාගාර පහසුකම් හා ආහාරපාන පහසුකම්
- නේවාසිකාගාර පහසුකම්
- නිස්කලංක පරිසරය
- වාහන නැවැත්වීමේ පහසුකම්
- ක්‍රීඩාපිටිය













